ගම්පොල නගර සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 21 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 28 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ගම්පොල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉඩම් හා ගොඩනැගිලි 4 ක සංවර්ධන වියදම රු.2,617,875 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුවේ. | කර්මාන්ත 3 හිම වටිනාකම ප්‍රාග්ධනිත කර ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබුණු රු.1,591,226 ක වටිනාකම වූ යන්ත්‍ර හා උපකරණ ද රු.548,213 ක් වටිනාකම වූ ආයුර්වේද ඖෂධ තොගය ද ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්
------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.53,657,082 ක් වූ ගිණුම් ශේෂ 3 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.2,701,240 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කළ යුතුවේ. | වෙනස පරීක්ෂා කර නිවැරදි කරන බව දන්වමි. |

(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) වසරක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.90,979,928 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාළ ආයතන දැනුවත් කර ඇත. |
| (ii) වසර 1 ක කාලයක් ඉක්මවා තිබුණු ගෙවිය යුතු ශේෂවල වටිනාකම රු.23,108,852 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.46,516,252 ක් වූ ගිණුම් විෂයයන් 3 කට අදාළව උපයෝගී ලේඛන හා ශේෂ සනාථ ලිපි යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම්ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කිරීම. | උපලේඛන සොයා ගැනීමට නොහැකි අතර, අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි.<br><br>ශේෂ සනාථ ලිපි ඉල්ලා ඇතත් ප්‍රතිචාර දක්වා නොමැත.<br><br>ශේෂ වාර්තා ඉල්ලා ඇතත් මේ දක්වා ලැබී නොමැත. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ 36(ඉ) වගන්තිය | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි බදු දීමේදී විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන සභා තීරණ මත බදු දී තිබුණි. | නගර සභා ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. | ඇතැම් දේපළ සභා තීරණ මත බදු දී ඇත. ඉදිරියේදී තක්සේරුව මත අමාත්‍යවරයාගේ අනුමැතියෙන් බදු දීමට කටයුතු කරමි. |
| (ආ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන පළාත් පාලන | 2016 වර්ෂයේ ටෙන්ඩර් කරන ලද කඩ කාමරවලින් එක්වන් මුදල් රු.86,512,738 ක් අය කර ගෙන | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. | 2019 ජනවාරි සිට ප්‍රමාද ගාස්තු අය කෙරේ. |

| | |
|---|---|
| කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 01 හා 04 (1) ඡේදය | නොතිබුණු අතර, කඩ කුලී ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.77,971,316 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.26,731,108 ක් විය.

2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.569,500 ක් වටිනා අගරු චෙක්පත් නිරවුල් කර නොතිබුණි. | අගරු චෙක්පත නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 29,800,000 | 31,936,586 | 30,616,461 | 45,014,756 | 3,190,000 | 63,788,716 | 30,823,412 | 49,005,556 |
| (ii) | කුලී | 12,000,000 | 13,505,481 | 9,180,131 | 18,745,201 | 10,509,000 | 12,440,539 | 8,689,463 | 14,594,084 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,600,000 | 2,824,831 | 2,784,831 | 40,000 | 2,500,000 | 2,663,854 | 2,663,854 | - |
| (iv) | වෙනත් ආදායම් | 48,140,000 | 12,570,838 | 29,968,107 | 93,566,930 | 32,050,000 | 55,745,470 | 30,258,818 | 49,441,827 |
| | | 92,540,000 | 60,837,736 | 72,549,530 | 157,366,887 | 48,249,000 | 134,638,579 | 72,435,547 | 113,041,467 |

2.3.2 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.173,879,203 ක් වුවද, වර්ෂය තුළ රැස් කරන ලද ආදායම රු.72,549,530 ක් | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | පිළිගනිමි. |

වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 42 ක් විය.

2.3.3 වරිපනම් හා බදු
--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ආයතන 12 කින් රු.2,412,466 ක් ද නීතිඥ කාර්යාල සංකීර්ණයෙන් රු.98,082 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. | රජයේ ආයතනවලින් අයවිය යුතු මුදල අයකර ගත යුතුවේ. | පිළිගනිමි. |

2.3.4 කුලී
------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දීර්ඝ කාලීනව අය නොවන රු.938,303 ක මස්කඩ කුලී ශේෂයක් විය. | කඩ කුලී කාලීනව අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ආ) | නීතිඥ කාර්යාල සංකීර්ණයෙන් රු.352,241 ක බදු කුලී හිඟයක් විය. | බදුකුලී කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ඇ) | පොදු වෙළඳපළ මාලුකඩ කාමර බදු දී වසර 5 ක් ඉකුත් වී ඇතත්, රු.1,665,238 ක එක්වන් මුදල් හා නව තක්සේරුව අනුව කඩ කුලී රු.711,660 ක් අයකර ගෙන නොතිබුණි. | එකවර ගෙවීමේ මුදල් චක්‍රලේඛ උපදෙස් අනුව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |
| (ඈ) | ලංගම බස් නැවතුම අසල සාප්පු සංකීර්ණයෙන්, බදු කුලී රු.1,697,074 ක් අයකර ගෙන නොතිබුණි. | බදු ගිවිසුම් අනුව කටයුතු කර සහා අරමුදලට ලැබිය යුතු ආදායම් ලබා ගත යුතුවේ. | හිඟ මුදල අයකර ගැනීමට නීතිඥවරයා හරහා ඒන්තර වාසියක් යවා ඇත. |
| (ඉ) | පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර වසර 5 කට වරක් තක්සේරු කළ යුතු වුවද 2008 වර්ෂයෙන් පසු තක්සේරු කර නොතිබුණි. | කඩ කාමර වසර 5 කට වරක් තක්සේරු කළ යුතුවේ. | පොදු වෙළඳපළ අසාර්ථක ව්‍යාපෘතියකි. පාරිභෝගිකයින් පොදු වෙළඳපොළට නොපැමිණීම හේතුවෙන් කඩ කාමර වසා දමා ඇත. බිල්කර නොමැති බැවින් තක්සේරුවක්ද කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පොදු වෙළඳපොළ කඩ කාමරවලින් රු.5,132,158 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. | බදු ගිවිසුම් අනුව සභා අරමුදලට ලැබිය යුතු ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නැත. |
| (උ) | ගම්පොල දුම්රිය මාර්ගයට ඉහළින් ඉදිකර ඇති වෙළඳ සංකීර්ණයෙන් 2005 සිට 2018 වර්ෂය දක්වා කාලයට අදාළව රු.9,980,988 ක කඩ කුලී අයකර නොතිබුණි. | බදු ගිවිසුම් අනුව සභා අරමුදලට ලැබිය යුතු ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම දේපළ සඳහා නඩු අංක එස් 6789 යටතේ නඩු පවරා ඇත. |
| (ඌ) | ඉඩම් බදුදීම්වලට අදාළව බදුකරුවන් 35 දෙනෙකුගෙන් අයකරගත යුතු එකවර ගෙවීමේ මුදල් රු.13,500,921 ක් හා බදුකරුවන් 112 දෙනෙකුගෙන් වාර්ෂික බදු කුලී රු.2,119,398 ක් අයකර ගෙන නොතිබුණි. | එකවර ගෙවීමේ මුදල්, බදු මුදල් විධිමත්ව අය කිරීම හා වර්ෂ 5 කට වරක් බදු මුදල් සංශෝධනය කළ යුතුවේ. | සභා තීරණ මත ඉඩම් බැහැර කර තිබුණද රජයේ තක්සේරුවට අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

2.3.5 වෙනත් ආදායම්

--------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | -------------- | ----------------------------- |
| (අ) | තානායම් ගාස්තු<br>------------------- | | |
| | 2018 වර්ෂය තුළ තානායම් ගාස්තු අයවී නොතිබුණු අතර, හිඟහිටි තානායම් ගාස්තු ශේෂය රු.1,611,276 ක් විය. | අදාළ ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ආ) | පොදු වැසිකිළි ගාස්තු<br>------------------------- | | |
| | වසර කීපයක සිට නිරවුල් නොවූ පොදු වැසිකිළි ගාස්තු ශේෂය රු.1,102,887 ක් විය. | අදාළ ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| -------------------------- | -------------- | ------------------------------- |
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,543,294 ක් හා මුද්දර ගාස්තු රු.84,873,710 ක් විය. | අදාළ මුදල් සභාව වෙත ගෙන්වා ගත යුතුවේ. | පිළිගනිමි. |

3. මෙහෙයුම් සමාලෝචනය
-------------------------------

3.1 කාර්ය සාධනය
-------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා
-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 7 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගැනීම කළ යුතුවේ. | පිළිගනිමි. |

(ආ) ප්‍රතිපාදන නොසැලසීම
---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් 26 ක් ඉටු කර නොතිබුණි. | සභාව ඉටුකළ යුතු කර්තව්‍යයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතුවේ. | පිළිගනිමි. |

(ඇ) අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) ලබා නොගැනීම
--------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහල් 3 කින් යුත්තව ඉදිකිරීමට සැලසුම් කළ පොදු වෙළඳපළ මහල් 2 ක් රු.2,002,742,936 ක් වැයකර ඉදිකර තිබුණි. වසර 13 ක් ගතවී ඇතත්, ඉහළ මහල ඉදිකිරීමට කටයුතු කර නොතිබුණු අතර, කොන්ක්‍රීට් කොටස් පුපුරා එම ස්ථානවලින් වැසි ජලය කාන්දු වීම් පැවතුණි. | අපේක්ෂිත නිමැවුම් මට්ටම ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභාව මෙම ව්‍යාපෘතියේ සම්බන්ධීකරණය පමණක් සිදු කර ඇත. උඩුමහලේ ජල කාන්දුව වැළැක්වීමට වහලයක් ගැසීමට ඇස්තමේන්තු සකසා ඇත. |

(ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ දෛනිකව එකතුවන කසළ කළමනාකරණය කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකසා නොතිබුණි. | සන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා දීර්ඝකාලීන වැඩපිළිවෙළක් සකස් කිරීමට කටයුතු කළ යුතුවේ. | ගම්පොල නගර සභාව සතුව කසළ බැහැර කරන ස්ථානයක් නොමැති වීම නිසා කුණ්ඩසාලේ හා මහනුවර කොම්පෝස්ට් අංගනවලට මුදල් ගෙවා කසළ බැහැර කර ඇත. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආසියානු සංවර්ධන ණය සඳහා දීර්ඝ කාලීනව ගෙවිය යුතු රු.497,132 ක ශේෂයක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ණය ශේෂය පියවීම සඳහා ශේෂ සනාථ ඉල්ලා ඇතත්, පිළිතුරු නොලැබුණි. |
| (ආ) | විදුලිබල මණ්ඩලයට පවරා තිබුණු රු.42,063,401 ක වත්කම අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | අත්තිකාරම් පියවන ලෙස ලිඛිතව දන්වා ඇත. |
| (ඇ) | පොදු වෙළඳපොළේ කඩ කාමර 102 ක් ව්‍යාපාරික කටයුතු කිරීමෙන් තොරව ද කඩ කාමර 36 ක් බඳු දීමට කටයුතු නොකර වසා දමා තිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක පුරප්පාඩු හා අතිරික්තතා | | |
| (i) | සේවක අතිරික්තතා 8 ක් හා සේවක පුරප්පාඩු 37 ක් විය. | අතිරික්තතා ඇති නොවන ලෙස ද පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ද කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ii) | කාර්යාල කාර්ය සහායකවරු 04 දෙනෙක්, මාර්ග හා සෞඛ්‍ය කම්කරුවන් 4 දෙනෙක් හා මාතෘ සායන සහායිකාවන් 3 දෙනෙකු කාර්යාලයේ රාජකාරී සඳහා යොදවා තිබුණි. | තනතුරට අදාළ රාජකාරී පැවරීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත |
| (ආ) | සේවක ණය | | |
| | වර්ෂ 01 - 18 දක්වා කාලයට අදාළව අය නොවී පවතින රු.710,242 ක සේවක ණය ශේෂයක් පැවතුණි. | සේවක ණය නිරවුල් කර ගත යුතුවේ. | පළාත් භාණ්ඩාගාරය හරහා පියවා ගැනීමට ලිපි යවා ඇත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂ 5 කට වරක් සහා දේපළ තක්සේරු කළ යුතු වුවත්, 2008 වර්ෂයේ තක්සේරුව මත 2018 වර්ෂයේදී ද වරිපනම් බදු අය කර තිබුණි. | වරිපනම් බදු අයකරන ප්‍රදේශවල දේපළ වසර 5 කට වරක් තක්සේරු කළ යුතුවේ. | අවසන් වරට 2009 වසරේ තක්සේරු කර ඇත. නව තක්සේරුවක් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සභාව සතු නීතිඥ කාර්යාල 15 ක වසර 10 ගිවිසුම් කාලය අවසන් වී තිබුණ ද, විධිමත්ව තක්සේරු හා ටෙන්ඩර් කර බදුදී නොතිබුණි. | ගිවිසුම්ගත වී තක්සේරු කර ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර බදු දීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නැත. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වත්කම් තක්සේරු කර ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් ලේඛනගත කිරීමට කටයුතු කළ යුතුවේ. | වත්කම් ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |

3.5.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,235,220 ක වටිනාකම වූ වත්කම් වර්ග 5 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. | අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | වෙන්දේසි කිරීමට ඇති ද්‍රව්‍ය වෙන්දේසියටද, අලුත්වැඩියා කිරීමටද, ට්‍රැක්ටරය භෞතික වස්තුවක් ලෙස ප්‍රදර්ශනය කිරීමටද කටයුතු කෙරෙමින් පවතී. |

3.5.3 වාර්ෂික භාණ්ඩ/තොග සමීක්ෂණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයට භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණය සිදු කළ යුතුවේ. | ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කරමි. |
| (ආ) | 2017 භාණ්ඩ සමීක්ෂණයේදී වෙන්දේසි කිරීමට නියමවූ රු.215,954 ක් වටිනාකම වූ භාණ්ඩ වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි. | වෙන්දේසි කිරීමට නියම වූ භාණ්ඩ වෙන්දේසි කළ යුතුවේ. | ඉදිරි භාණ්ඩ සමීක්ෂණයෙන් ලැබෙන ද්‍රව්‍ය සමඟ වෙන්දේසි කරමි. |

3.6 ප්‍රසම්පාදනය

----------------

කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **නගර සභා ශ්‍රවනාගාරය සභා ශාලාව ලෙස වෙනස් කිරීම** | | |
| සභා අරමුදල් යොදා ගනිමින් නගර සභා ශ්‍රවණාගාරය සභා ශාලාව ලෙස වෙනස් කිරීමේ කොන්ත්‍රාත්තුවෙහි විවෘත මිල කැඳවීමේ අවශ්‍යතාවය නොපෙන්වීමට I අදියර සඳහා රු.2,000,000 ක් හා II අදියර සඳහා රු.2,000,000 ක් වශයෙන් සීමිත මිල කැඳවීමක්ද සිදු නොකර සමූපකාර සංවර්ධන සමිතියට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවේ. | අදියර දෙකක් යටතේ ඉටු කලේ සභාවේ පැවති මූල්‍ය තත්ත්වය සලකා බලා දන්වමි. කඩිනමින් නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ අවශ්‍යතාවය පැවතුණි. |